ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2022/2023
අවසාන පරීක්ෂණය - 2023
SNP8244/SNP8334 -විශේෂ තත්ත්වයන් සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම
කාලය - පැය තුනයි. (03)

0 18

---

දිනය - 2023.12.16 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. විශේෂ අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ඇති ළමුන් වර්ග පහක් (05) ක් ලැයිස්තුගත කර ඔවුන්ට ලබාගත හැකි සේවාවන් සඳහා උදාහරණ සඳහන් කරන්න.

02. ඇසීමේ පොදු දෝෂ තුනක් (03) සඳහන් කරන්න. ඒවායින් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. මස්තිෂ්කාඝාතය (Cerebral Palsy) ඇතිවීමට හේතු පහක් (05) ලැයිස්තු ගත කරන්න.

04. මාංශපේෂී පරිහානියේ (Muscular Dystrophy) ලක්ෂණ හතරක් (04) සඳහන් කරන්න.

05. දියවැඩියාවෙහි ප්‍රධාන වර්ග තුන (03) නම් කර ළමුන් අතර බහුලව දක්නට ලැබෙන දියවැඩියා වර්ගයෙහි රෝග ලක්ෂණ පැහැදිලි කරන්න.

06. අන්තර්කරණ පන්ති කාමරයක රූමැටික් හෘද රෝග සහිත දරුවන්ට ලබාදිය හැකි පන්ති කාමර සහයන් පහක් (05) යෝජනා කරන්න.

07. ක්ෂුද්‍ර කපාලතාවයේ (Microcephaly) හි පොදු ලක්ෂණ පහක් (05) සඳහන් කර ක්ෂුද්‍ර කපාලතාවය (Microcephaly) හටගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ගුරුවරුන් විසින් ගොතගැසීම සහිත සිසුන් සඳහා ලබා දිය හැකි පන්තිකාමර සහයන් පහක් (05) පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) සෞඛ්‍ය ඌනතා යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) පොදු සෞඛ්‍ය ඌනතා වර්ග තුනක් (03) සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඔබ අපස්මාරය සහිත සිසුන්ට අධ්‍යාපනික සහය සපයන ගුරුවරයකු යැයි සිතන්න. ඉගෙනීම සඳහා ඔබ ඔවුන් තුළ නිරීක්ෂණය කර ඇති බාධක තුනක් (03) ලැයිස්තුගත කර එම බාධක සඳහා ඔබට සහය වියහැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

10. (i) සුවිශේෂී ඉගෙනුම් දුබලතා ප්‍රධාන වර්ග තුන (03) නම් කරන්න. ඒවායින් එකක් (01) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ඉහත සඳහන් කළ සුවිශේෂී ඉගෙනුම් දුබලතා තුනෙහි පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා විස්තර කරන්න. (ලකුණු 05)

(iii) ඔබ ඉගෙනුම් දුබලතා සහිත සිසුන්ගේ ගුරුවරයකු යයි උපකල්පනය කරන්න. ඔබට අන්තර්කරණ පන්තිකාමරයක ක්‍රියාත්මක කළ හැකි හොඳම භාවිතයන් පහක් (05) පරීක්ෂා කරන්න. (ලකුණු 12)

11. (i) ප්‍රධාන කථන අක්‍රමතා වර්ග තුනක් (03) නම් කරන්න. (ලකුණු 03)

(ii) ගුරුවරුන් ලෙස ඔබට සිසුන් අතර කථන අක්‍රමතා හඳුනාගත හැකි ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඔබේ පන්තිකාමරයේ කථන අක්‍රමතා සහිත සිසුන්ට ඔබට උපකාර කළ හැකි ආකාරය විස්තර කරන්න. එම එක් කථන අක්‍රමතාවන් අවම කිරීම සඳහා යෝජනා තුනක් (03) සමඟ අගයන්න.

(ලකුණු 12)

12. (i) නීත්‍යානුකූල අන්ධභාවය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) ළමුන් අතර ඔබට නිරීක්ෂණය කළ හැකි පොදු දෘෂ්ටි ඌනතා වර්ග තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) දෘෂ්ටි ඌනතා සහිත දරුවන්ට ඉගැන්වීමේ දී ඔබ මුහුණ දෙන අභියෝග පහක් (05) විස්තර කර එම අභියෝගවලට ඔබ මුහුණ දෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. (i) ව්‍යසනකාරී චර්යා අක්‍රමතාව නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) ළමුන් අතර පවතින චර්යා අක්‍රමතා වර්ග තුන (03) නම් කරන්න. (ලකුණු 03)

(iii) ඉහත චර්යා අක්‍රමතා වර්ග තුන (03) පහත සඳහන් මාතෘකා ඔස්සේ විස්තර කරන්න.

අ) චර්යා අක්‍රමතා සඳහා හේතු

ආ) චර්යා අක්‍රමතාවල ගති ලක්ෂණ පහ (05) බැගින්

ඇ) පන්ති කාමරයේ චර්යා කළමනාකරණ උපාය මාර්ග පහ (05) බැගින්

(ලකුණු 15)

14. (i) සාමාන්‍යයෙන් සහජ දක්ෂතා ඇති පුද්ගලයෙක් ලෙස හඳුනාගත් කෙනෙකු ඉතාත උසස් මට්ටමේ බහුවිධ නිපුණතා ඇති අයෙකු ලෙස ප්‍රකාශ කිරීම වඩා යෝග්‍ය ය. (Gagne, 1996) සුභග සහ දක්ෂ යන පද නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) සුභග සිසුන් තුළ දැකිය හැකි ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න. ඒවායින් තුනක් (03) සුදුසු උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) අන්තර්කරණ පන්තිකාමරයක් තුළ ගුරුවරුන්ට සුභග හා දක්ෂ සිසුන්හට උපකාර කළ හැකි ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.